# මලිදූව ග්‍රාමයේ එකල පැවැති සමාජ පසුබිම පිළිබඳ පුස්කොළපොත් ආශ්‍රයෙන් අධ්‍යනයක්

**රණසිංහ එම්.ඩී.**[1]

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මලිදූව ග්‍රාමසේවා වසමට අයත් මලිදූව ග්‍රාමය ස්වභාව සෞන්දර්යයෙන් අනූන වටපිටාවක පිහිටා ඇත. මලිදූව ග්‍රාමයේ තුළ පැවැති පුස්කොළපොත් ආශ්‍රයෙන් ආගමික ඇදහිලි හා විශ්වාසයන්, සෞඛ්‍ය යනාදි ක්ෂේත්‍ර ඔස්සේ සමාජ පසුබිම අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වනඅතර මලිදූව ග්‍රාමයේ එකල පැවැති සමාජ පසුබිම කුමන ස්වරූපයකින් පැවතියේද යන්න අධ්‍යනය කිරීම පර්යේෂණයේ ගැටලුව ලෙස පෙන්වා දිය හැකිය.මෙම පර්යේෂණය සඳහා දත්ත එක්රැස් කිරීම සඳහා මලිදූව ග්‍රාමය තුළ වර්තමානය වනවිට ඉතිරිව ඇති පුස්කොළපොත් පමණක් අධ්‍යනයට ලක්කළ අතර ප්‍රධාන වශයෙන් ගමෙහි කේන්ද්‍රීය ස්ථානයවූ මලිදූව ශ්‍රී විජයානන්ද විහාරස්ථානයේ පැවති පුස්කොලපොත් ද, මීට අමතරව අතීතයේ සිටම පාරම්පරික වශයෙන් පුස්කොළපොත් භාවිතයෙහි ගමෙහි ප්‍රචලිත පුද්ගලයින් වූ පේමචන්ද්‍ර රණසිංහ,ජයතිස්ස ඇල්ලලගොඩ, සෝමදාස කටුවන්දෙණිය මහතා, චාර්ලිස් රණසිංහ මහතා ,අල්විස් රත්නායක මහතාගේ පුස්කොළපොත් මේ සඳහා යොදා ගත්අතර පුස්කොළපොත් අධ්‍යනයේදී මෙම ග්‍රාමය තුළ ගුප්ත විද්‍යාව ආශ්‍රිත කටයුතු වන යාගහෝම, බලිතොවිල් යනාදිය ඉතා ඉහළ අන්දමින් ක්‍රියාත්මක වී ඇතිබැව් පසක් වේ. ඒ කෙසේදයත් අධ්‍යනයට ලක් කරන ලද පුස්කොළපොත් රාශියක බුදුගුණ වර්ණනා කොට ඉන් අනතුරුව මන්ත්‍ර සඳහන් වීමය. පේමචන්ද්‍ර රණසිංහ මහතාගේ පුස්කොළපොතක සඳහන් මන්ත්‍රයක පළමුව නමෝබුද්ධාය ඕතමෝ විසාලාමහනුවරදත් උදියාසිගාකල පාපයෙන්ගල්ව ඉපිද යනාදි වශයෙන් බුද්ධ චරිතය දක්වා පසුව ඕංහ්‍රීංමහමන්ද නපිලහේවිෂනු ගිනිහරහරාඩිසන් යනුවෙන් මන්ත්‍ර දැක්වීම නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. එසේම නක්ෂත්‍ර කටයුතුද එකල ගැමි ජනතාවගේ ජීවිත සමග බද්ධ වී ඇති බව පෙන්වා දිය හැකි අතර ඒ සූර්ය මාස,චන්ද්‍රමාස භාවිතා කොට එකල ජනයා ජන්ම පත්‍රය පුස්කොළපොත් භාවිතා කොට නිර්මාණය කිරීම නිසාවෙනි.මෙහිදි චාර්ලිස් රණසිංහ මහතාගේ ජන්ම පත්‍රය අධ්‍යනයට ලක්කළ විට පුවපුට නැකත,අටවක යනාදිය දක්වා තිබීම පෙන්වා දියහැකිය. එකල දියුණු සෞඛ්‍ය පහසුකම් පැවැති බව දැක්විය හැකි අතර ඒඅක්ෂි රෝග සඳහා පාරම්පරික වෛද්‍ය ක්‍රම ඇතුළත් පුස්කොළපොත් සෝමදාස කටුවන්දෙණිය මහතා සතුව පැවතීම නිසාවෙනි.එපමණක් නොව මලිදූව ශ්‍රී විජයානන්ද විහාරස්ථානය තුළ පැවති පුස්කොලපොත් රාශිය මගින් ධර්ම කරුණු රාශියක් ඇතුළත් වන අතර එහි සූත්‍ර,ගාථා සහ විනය ඇතුළත් වන අතර ඒ අනුව මෙම ග්‍රාමය තුළ බුදුදහම ප්‍රධාන අංගයක් වීඇති බවට පසක් වේ. මලිදූව ග්‍රාමයේ සමාජ පසුබිම පිළිබඳ පුස්කොළපොත් ආශ්‍රිතව අධ්‍යනයේදී බුදුදහම, ගුප්ත විද්‍යාව ප්‍රධාන අංග වීඇති බවත් දියුණු වෛද්‍යක්‍රම සහිතව සාමකාමී පරිපූර්ණ සමාජ පසුබිමක් මලිදූව ග්‍රාමයේ එකල පැවැති බව දැක්විය හැකිය.

**මුඛ්‍ය පද :** මලිදූව ග්‍රාමය, සමාජ පසුබිම, පුස්කොළපොත් ගුප්ත විද්‍යාව, බුදුදහම

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. madunidil@gmail.com